**1981 අංක 17 දරණ පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් පනතේ 18 වන වගන්තිය යටතේ පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්ගේ වාර්තාව -2016**

**හැඳින්වීම**

පරිපාලනයට අදාල සියලුම නෛතික ක්‍රියාවන් මගින් මහජනයාට අදාලව ඔවුන්ගේ හැසිරීම් හා අයිතිවාසිකම් සම්බන්ධයෙන් සුපරික්ෂාකාරීව මනස යොමු කිරීමත් ....... යම් බාධාවක් මත පෙනීම හෝ ආලෝකය නොවැටෙන අඳුරු ස්ථානයක් වෙත ඔහු/ඇය සතු විවේචනාත්මක සහ සුපරික්ෂාකාරී සහන යොමු කිරීමත් ඔම්බුඩ්ස්මන්වරයකු සතුව තිබිය යුතු මූලික ගුණාංගයන් බවට උගත් ගරු අගවිනිසුරුවරයකු සඳහන් කරන අතරම, ඔහු/ඇය අයිතිවාසිකම් සුපරික්ෂාකාරීව නිරික්ෂණයන්ට, නිවැරදිව එළඹී ඇති විටදී සහ වඩා සුදුසු කුමක්ද යන්න පැහැදිලි අවස්ථාවන්හිදී ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාදාමයන් අනුගමනය කරමින් නිවැරදි කිරීම් සිදු කිරීමට පියවර ගැනීමේ හැකියාව ද ඇති බවටද වැඩිදුර අදහස් දක්වා ඇත.

"දෙවනඟන ඇයගේ දෙනෙත් ආවරණය කරගෙන සිටින්නේ, නීතිඥයින් හා විනිශ්චයකාරවරුන් කටයුතු කරන අයුරු නොපෙනීම සඳහා ය." "ෆ්‍රැන්ක් මැක් කිනි හියුබර්ඩ්" – 1867-1930

ඔම්බුඩ්ස්මන් සඳහා එක්, විශ්වීය නිර්වචනයක් නොමැත. කෙසේවෙතත්, ඔම්බුඩ්ස්මන් යනු රාජ්‍ය පරිපාලනයේ ක්‍රියාකාරකම් (හෝ එහි අඩුව) පිළිබඳ පැමිණිලි ලැබෙන, විමර්ශනය කර වාර්තා කරන ආයතනයක් බව කවුරුත් දන්නා කරුණකි.

එවැනි ස්වාධීන, සැමට පහසුවෙන් ළඟා විය හැකි, රටක රාජ්‍ය පරිපාලනය පාලනය කිරීමට බලතල සහිත ආයතනයක් පිළිබඳ සංකල්පය ලොවපුරා පිළිගෙන ඇති අතර, එය විවිධ ජාතීන්ගේ නීති පද්ධතීන්ට අන්තර්ගත කර ඇත. අද වන විට අන්තර්ජාතික ඔම්බුඩ්ස්මන් ආයතනය, ලොවපුරා පැතිරී ඇති රාජ්‍ය අංශයේ සාමාජික සංවිධාන 147කින් සහ සියළුම මහද්වීප වල පිහිටි අධිකරණ 87කින් සමන්විත, සමූහ සංවිධානයකි.

ඔම්බුඩ්ස්මන්ගේ භූමිකාව පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ මණ්ඩල යෝජනා 63/169 හි සඳහන් වන පරිදි, ඔවුන්ගේ කාර්යයන්හිදී අදාල ප්‍රමිතීන්ට අනුගත විය හැකි අයුරින් ඔම්බුඩ්ස්මන් සතු බලතල

සැකසීමේදී මානව සම්පත් පිළිබඳ ප්‍රමිතීන් පිළිබිඹු වන අයුරින් සැකසිය යුතුය. ඵලදායී පිළියම් යෙදීම ඇතුළුව සාධාරණත්වයට ළඟාවිය හැකි බව, අධිකරණයට ළඟා විය හැකි බව, සාධාරණ සමේෂණය, සහන, අධිකරණ ආරක්ෂාව, නියමිත ක්‍රියාවලිය, නෛතික නියතභාවය, අනිසි ප්‍රමාදය, සාධාරණ කාලය සහ වෙනස් ලෙස නොසැලකීම මෙම ප්‍රමිතීන්ගෙන් කොටසක් වේ. යෝජනාවලිය මඟින් "ඔම්බුඩ්ස්මන්ගේ ස්වාධීනත්වයේ සහ ස්වෛරීභාවයේ වැදගත්කම ගෙනහැර දක්වන අතර, අන්තර්ජාතික මානව හිමිකම් බැඳීම් වලට අනුගත වෙමින් ජාතික ව්‍යවස්ථාදායකය සහ ජාතික ප්‍රතිපත්ති සම්පාදනය කිරීම සඳහා රජයට උපදෙස් දීම මඟින්" මෙම ආයතන වලට සක්‍රීය දායකත්වයක් ලබා දිය හැකි බව අවධාරණය කරයි.

ඔම්බුඩ්ස්මන්ගේ භූමිකාව පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ මණ්ඩල යෝජනා 65/207 මඟින් යෝජනා 63/169 හි සඳහන් කරුණු නැවත නැවතත් ඉස්මතු කරන අතර, ජාත්‍යන්තර ඔම්බුඩ්ස්මන් ආයතනයේ කාර්යයන්හි තෘප්තිමත්භාවය, "ස්වාධින සහ ස්වෛරී ඔම්බුඩ්ස්මන්වරයකු ශක්තිමත් කිරීම සලකා බැලීම" සඳහා රාජ්‍යයන් පොළොඹවමින්, "පැරිස් මූලධර්ම වලට අනුකූලව යෝග්‍ය ලෙස ක්‍රියා කිරීම" සඳහා ඔම්බුඩ්මන්වරයා පොළොඹවයි.

මෙම යෝජනාවලියෙහි "රාජ්‍ය පරිපාලනයේදී, යහපාලනය ප්‍රවර්ධනය කිරීම සඳහා" ඔම්බුඩ්ස්මන් විසින් ඉටුකරන භූමිකාව පිළිබඳව ද සඳහන් වේ. "යහපාලනය" යනු විනිවිදභාවයෙන් යුක්ත, සාධාරණ, සර්වග්‍රාහී සහ නියෝජනාත්මක තීරණ ගැනීමේ ක්‍රියාවලියක් බවත්, පරිපාලනය එම තීරණ කුමන ක්‍රමවේදයක් මඟින් ක්‍රියාවට නංවන්නේද යන්නත් අවබෝධ වේ. මෙම තීරණ ක්‍රියාවට නැංවීම අධීක්ෂණය සඳහා ඔම්බුඩ්ස්මන් ආයතන වැදගත් වේ.

කාලීන, ගුණාත්මක, සේවාවක් මහජනයාට ලබාදීමට රජයට සහ වෙනත් ආයතන, ඔම්බුඩ්ස්මන්වරයා විසින් උනන්දු කරවනු ලබයි. මෙම ආයතනයේ එක් වැදගත්ම ශක්තියක් වන්නේ යුක්තිය ඉටුකර ගැනීමේ මාර්ගය කරා සාපේක්ෂව වඩාත් ලාභදායි හා වේගවත් පිරිවැයකින් තොර ක්‍රියාවලියක් කරා පැමිණිලිකරුවකුට යොමු වීමේ ඇති හැකියාවයි. මෙහි වටිනාකම වඩාත් වැඩිවන්නේ මෙවන් පැමිණිලිකරුවන් බහුතරයක් සමාජයේ වරප්‍රසාද අඩු පන්තියට අයත් වන්නන් හෙයිනි.

පුරවැසියන්ගේ දුක්ගැනවිලි වලට සහනයක් ලබා දෙන්නාවූත්, ඔවුන්ගේ මූලික අයිතිවාසිකම් ආරක්ෂා කරන්නාවූත්, ගරුත්වය නැවත ලබා දෙන්නාවූත්, එමෙන්ම ප්‍රජාතාන්ත්‍රික ක්‍රියාවලිය තුළ විශ්වාසය තහවුරු කරන්නාවූත්, ස්වාධීන, අපක්ෂපාතී, ලාභදායි ආරාවුල් විසඳීමේ යාන්ත්‍රණයකට ප්‍රවේශ වීමට පුරවැසියන්ට හැකියාව ලබා දෙන්නා වූ වේදිකාවක් ඔම්බුඩ්ස්මන් ක්‍රමය මගින් සපයනු ලැබේ.

ශ්‍රී ලංකාවේ ඔම්බුඩ්ස්මන් කාර්යාලයක අවශ්‍යතාව පිළිබඳව ප්‍රථම වරට සාකච්ඡාවට භාජනය වූයේ 1966 ජනවාරි මාසයේ පැවති අග්නිදිග ආසියානු විනිසුරුවන්ගේ සම්මේලනයේදී ය. පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්) ධූරය ස්ථාපනය කිරීම සඳහා 1978 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 156 වන වගන්තියෙන් පාර්ලිමේන්තුවට බලය පවරා දෙනු ලැබීය. එම ධූරය ස්ථාපනය කරමින් එම ධූරයේ බලතල, වගකීම් හා කාර්යයන් අර්ථ නිරූපනය කළ 1981 අංක 17 දරන පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් පනත පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලැබීය. මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් පිළිබඳව හෝ වෙනත් අසාධාරණ සම්බන්ධයෙන් හෝ මහජනතාව වෙතින් ඔම්බුඩ්ස්මන්වරයාට සෘජුව ලැබෙන චෝදනා හෝ පැමිණිලි, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට දැනුම් දීමට යටත්ව සලකා බැලීමට ඔම්බුඩ්ස්මන්වරයාට 1994 අංක 26 දරන පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමාසාරිස් (සංශෝධන) පනතින් අදාල මුල් පනතේ 10 වන වගන්තිය සංශෝධනය කරමින් බලය පවරා තිබේ.

පරීක්ෂණය අවසානයේදී අදාල චෝදනාවට ලක් වූ රජයේ නිලධාරියා විසින් ගෙන ඇති තීරණය, නිර්දේශය, ක්‍රියාව හෝ නොකර හැරීම නීතියට පටහැනි වන්නේ ද, අසාධාරණ ද, පීඩාකාරී ද, නොමනා වෙනස්කම් දක්වන්නේ ද නැතහොත් ඔහුගේ අභිමතය අයථා ලෙස භාවිත කිරීමක් ද යන්න ඔම්බුඩ්ස්මන්වරයා විසින් නිර්ණය කිරීම අවශ්‍ය වේ.

රජයේ නිලධාරියකු විසින් පුද්ගලයකුගේ මූලික අයිතිවාසිකම් කඩකර ඇති බව හෝ එවැනි නිලධාරියකුගෙන් අසාධාරණයක් සිදු වී ඇති බව නිසි විමර්ශනයකින් පසුව ඔම්බුඩ්ස්මන්වරයා සෑහීමකට පත්වන අවස්ථාවක ඒ සම්බන්ධයෙන් ඔහු විසින් තීරණයක් ගනු ලබයි.

යහපාලනය නූතන සමාජයේ මූලික අවශ්‍යතාවකි. සමස්තයක් වශයෙන් ජනතාවගේ පරම යහපත උදෙසා පරිපාලන කටයුතු දුෂ්කරතාවකින් තොරව සිදුකර ගෙන යාමේ වගකීම පැවරී ඇති රජයේ යාන්ත්‍රණවලට එදිනෙදා පරිපාලන කටයුතු පවත්වා ගෙන යාම සඳහා පුළුල් බලතල පැවරී ඇත. නීති, රෙගුලාසි, ස්වාභාවික යුක්තිය හා සාධාරණත්වය උල්ලංඝනය කිරීම සඳහා එම බලතල භාවිත කළ හැකි බවක් මින් අදහස් නොවේ. එදිනෙදා පරිපාලන ක්‍රියාවලිය සිදුවීමේදී අයථා පරිපාලනය තුලින් පුද්ගලයකුට යම් අයුක්තියක් සිදු වී තිබේනම් එකී අයුක්තියට හේතු සෙවීම, විමර්ශනය කිරීම, සහනයක් ලබාදීම හා එය නිවැරදි කිරීම සඳහා ඔම්බුඩ්ස්මන් කාර්යාලය පිහිටුවා ඇත. ඔම්බුඩ්ස්මන් ආයතනය විසින් සලකා බැලිය යුතු හෝ නිවැරදි කළයුතු ප්‍රධාන කරුණ වන්නේ බලතල අත්තනෝමතික ලෙස ක්‍රියාවේ යෙදවීම හෝ අවශ්‍ය පරිදි ක්‍රියාවේ යෙදවීම ප්‍රතික්ෂේප කිරීම සහ දූෂණ හෝ අගතිගාමී අභිප්‍රායන් මත පිහිටා නිල බැඳීම් ඉටුකිරීම ප්‍රමාද කිරීමේ උපාය මාර්ගයන් යොදාගැනීම යනාදිය ය.

## සංඛ්‍යාලේඛනාත්මක විශ්ලේෂණය.

2016 වසර තුලදී විමර්ශනය කිරීම සහ වාර්තා කිරීම සඳහා පාර්ලිමේන්තු පෙත්සම් කාරක සභාව මගින් යොමු කරන ලද පැමිණිලි 112ට අමතරව මහජනතාවගෙන් සෘජුව පැමිණිලි 1310 මෙම කාර්යාලයට ලැබිණ. 2015 අවසන පැමිණිලි 459 පරීක්ෂණ සඳහා ඉතිරිවීම මත 2016 වසර තුලදී සමාලෝචනය සඳහා පැමිණිලි 1881 පැවතිණ.

මෙම පැමිණිලි වලින් බහුතරයක් විභාග කරන ලද අතර, කෙටි කාලයක් ඇතුලත මහජන පෙත්සම් කාරක සභාවට ඉදිරිපත් කරන ලදී. මෙම කාර්යාලයෙන් ඉදිරිපත් කරන ලද සියලුම නිර්දේශ කාරක සභාව මගින් පිළිගෙන ඒ අනුව කටයුතු කරන ලද බව සඳහන් කළ යුතුය.

ලඝු වශයෙන් පැමිණිලි 1395ක් ද, අන්තර්පාර්ශව ලෙස පැමිණිලි 29ක් ද විමර්ශනය කර, සම්පූර්ණ වශයෙන් පැමිණිලි 1424ක් අවසන් කරන ලදී. 2016 වසර තුලදී පැමිණිලි 457ක් අවසන් නොවී 2017 යොමුවිය.

පැමිණිලි වලට අදාල කරුණු සම්බන්ධයෙන් ක්‍රියාකිරීම නිලධාරින් විසින් අනවශ්‍ය ලෙස ප්‍රමාද කරන අවස්ථා වැනි සිදුවීම් වලදී අදාල රාජ්‍ය නිලධාරින් දුරකථන මාර්ගයෙන් හෝ ලිඛිතව සම්බන්ධ කරගනිමින් ඒවා හැකි ඉක්මණින් නිරාකරණය කිරීමට මෙම කාර්යාලය උත්සාහ කර තිබේ. බොහෝ පැමිණිලි සිරිතක් ලෙසට අතිගරු ජනාධිපතිතුමාගේ, අග්‍රාමාත්‍යතුමාගේ, අමාත්‍ය මණ්ඩල අමාත්‍යවරුන්ගේ සහ අනෙකුත් සංවිධාන වලට යොමු කරමින් අවධානය පිණිස ඔම්බුඩ්ස්මන් වෙත පිටපත් ඉදිරිපත් කරන දුක්ගැනවිලි වලින් සමන්විත වේ. මෙම ක්‍රියාවලිය හේතුවෙන් එක් පැමිණිල්ලක් පිළිබඳ ආයතන කිහිපයක් තම කාලය සහ සම්පත් වැය කරමින් සමහර අවස්ථාවලදී පරස්පරනිර්දේශ ඉදිරිපත් කිරීම නිසා ඒ සම්බන්ධව ක්‍රියාකිරීමට අදාල නිලධාරියා ව්‍යාකූල තත්ත්වයකට පත් වේ. මේ නිසා මෙම කාර්යාලය අනෙකුත් ආයතනය වෙත යොමු කරන පැමිණිලිවල පිටපත් සම්බන්ධයෙන් සලකා නොබලයි. තවත් සමහර පැමිණිලි මගින් විභාග කිරීම ආරම්භ කිරීමට ප්‍රමාණවත් තරම් තොරතුරු ඉදිරිපත් නොවේ. උදාහරණයක් වශයෙන් යම් ස්ථානයකින් ස්ථාන මාරුවක් ලබාගැනීමට හෝ එම ස්ථානයේ රැඳී සිටීමට ඉල්ලා සිටින විට එම ස්ථාන මාරුව ලබාදීමට හෝ එම ස්ථානයේ රැඳී සිටීමේ කාලය දීර්ඝ කිරීම ලබා නොදීම සම්බන්ධයෙන් චෝදනා කරන විට එම ස්ථානයේ කොපමණ කලක් සේවය කලේද යන්න ඉදිරිපත් නොකරයි. සමහර පැමිණිලි වලදී, උදාහරණයක් ලෙස සුදුසුකම් නොමැතිව පත්වීමක් ඉල්ලා සිටින විට වැනි අවස්ථාවලදී විභාග කිරීමට තරම් අසාධාරණයක් බැලූ බැල්මට නොපෙනේ. සහනයක් ඉල්ලීමේ, අනවශ්‍ය ප්‍රමාදය ද පැමිණිලි ප්‍රතික්ෂේප වීමට හේතුවක් වේ.

උදාහරණයක් ලෙසට සේවය හැර ගිය පුද්ගලයකුගේ ඉල්ලීමක්, අතිවිශේෂ හේතු නොමැත්තේ නම්, මාස 03ක් ඇතුලතදී, එම තනතුරේ නැවත පිහිටුවීමට ඉල්ලුම් කළ යුතුය. පුද්ගලික ආරවුල් සහ අධිකරණ විසින් විමර්ශන කරන ගැටලු ඔම්බුඩ්ස්මන්ගේ රාජකාරියට ඇතුලත් නොවේ.

එසේම විදුහල්පතිවරුන්ගේ සහ ගුරුවරුන්ගේ මාරුවීම්, වැටුප් වර්ධක, උසස්වීම්, හිඟ වැටුප්, දීමනා සහ විශ්‍රාම වැටුප් සම්බන්ධයෙන් විශාල අභියාචනා ප්‍රමාණයක් යොමු වී තිබිණ. සමහර අවස්ථාවලදී නියමිත වේලාවට එම ආයතන මගින් වාර්තා ලබාගැනීම අසීරු වී ඇත. පාසල් වලට ළමුන් ඇතුළත් කිරීම සම්බන්ධයෙන් ද දෙමාපියන් චෝදනා ඉදිරිපත් කර තිබේ.

ලිඛිත පරීක්ෂණයෙන් විදුහල්පති ශ්‍රේණි සඳහා ප්‍රමාණවත් ලකුණු ලබා තිබියදීත් පත්වීම් ප්‍රදානය අසාධාරණ වීම සම්බන්ධයෙන් එම විභාගයට පෙනී සිටි ගුරුවරුන්ගෙන් විශාල සංඛ්‍යාවක් පැමිණිලි ලැබී තිබිණ.

සමහර ආයතන, වාර්තා කැඳවූ විට එකී වාර්තා ඉදිරිපත් කිරීම අනලස්ව සිදු නොකරන බව පෙනීයාම කණගාටුවෙන් හෝ සඳහන් කලයුතුය. එකී ආයතන අතර, මහවැලි අධිකාරිය, සෞඛ්‍ය අමාත්‍යාංශය සහ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව ප්‍රධාන වේ.

එකී ප්‍රශ්නය අමතරව, මහවැලි අධිකාරිය සහ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව ඔවුන් මුලින් ගෙන ඇති තීරණ වෙනස් කිරීමට කෙලෙසකින් සහ/හෝ අකැමැත්තක් ඇති බවට පෙනි යයි. මෙවැනි ආයතන වලින් සහනයන් බලාපොරොත්තුව පැමිණෙන අසරණ ජනතාවට මෙවැනි ක්‍රියාකාරකම්, ඍජුව බලපානු ලබයි. උදාහරණයක් ලෙසට අදාල පරීක්ෂණයක් සම්බන්ධව මහවැලි කලාප අධ්‍යක්ෂකවරයාම පෙනී සිටීමට දැන්වූ විට, ඉදිරිපත් කරනු ලැබුවේ ඉඩම් නිලධාරීවරයෙකි. දෙපාර්තමේන්තු ප්‍රධානීවරයාගේ උපදෙස් අනුව කටයුතු කරන බව පෙන්වමින් මෙම නිලධාරියා අදාල පරීක්ෂණයේදී කිසිම සාධාරණ තීන්දුවකට එළඹීමට එකඟ නොවුයේ, රජයේ නිලධාරියකු ලෙස සිය හැසිරීමටද නිගා කරමිනි. මෙම නිලධාරිවරයාගේ හැසිරීම, මෙම ආයතනයේ මූලික පරමාර්ථ සහ රාජකාරි කටයුතු අවදානම් තත්ත්වයකට පත් කරන ලදී.

හැකියාවෙන් පරිපූර්ණ අධ්‍යක්ෂ ජනරාල්වරයකු යටතේ වසර කිහිපයකට පෙර දක්වා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව ඔවුන්ගේ රාජකාරි කටයුතු යහපත් අන්දමකට සිදුකරන ලදී. එහෙත් ඉහත තත්ත්වය දැනට පහතට කඩා වැටි ඇති අතරම, ඒ අනුවම මෙම ආයතනයට සැලකිය යුතු ප්‍රමාණයක පැමිණිලි එක්වීම සිදු වේ. මෙහිදි මතකයට ගතයුතු කරුණක් වනුයේ නිලධාරින්, නීතිරාමුව මතම

යැපෙමින් කටයුතු කිරිම හැර විවෘත හදවතක් සහිතව, සහ තනතුරක් ලැබූ පමණින් හිතුමතේම ක්‍රියා නොකිරිමට අධිෂ්ඨාන කරගත යුතු බවටය.

දරුවන් පාසැල්වලට ඇතුලත් කිරිම සම්බන්ධයෙන් ගන්නා නව විධිවිධාන සම්බන්ධයෙන් ගරු අධ්‍යාපන අමාත්‍යතුමා සහ ඔහුගේ කාර්යක්ෂම ලේකම්වරයා කටයුතු කිරිම ප්‍රසංසාවට ලක්විය යුතුය. ඒ සමග විදුහල්පතිවරුන්ගේ සහ ගුරුභවතුන්ගේ ස්ථාන මාරුවීම් සහ උසස්වීම් සම්බන්ධයෙන් ද සාධාරණව කටයුතු සිදුවනු ඇතැයි බලාපොරොත්තු වෙමි. තවද එකම පාසැලක දිර්ඝ කාලයක් සේවය කරන ගුරුභවතුන් ස්ථාන මාරුකිරිමට අදාල පරිපාටියන්ට අනුව තරයේම සිදුවිය යුතු බවටද සඳහන් කරමි. මේ සම්බන්ධයෙන් ගරු අමාත්‍යතුමා සහ අමාත්‍යාංශය ගන්නා තීන්දු වෙනස් කිරීමට කිසිවකුට ඉඩ නොදිය යුතු අතරම, ලේකම්තුමා ඔහුගේ අමාත්‍යාංශය තුල ගැවසෙන ඉතා අල්ප වුවත් අදාල දූෂිත නිලධාරින් සම්බන්ධයෙන් විමසිල්ලෙන් සිටිම වැදගත් බවටත් සඳහන් කරමි.

“වාර්ගික, ආගමික, භාෂාමය අංශ සහ සෙසු ජන කොට්ඨාශ ඇතුලු ශ්‍රී ලංකාවාසී සකල ජනතාව අතර සහයෝගිතාව සහ අන්‍යෝන්‍ය විශ්වාසය වඩාලීමෙන් ජාතියේ සමගිය තහවුරු කිරීමද” යන්න ව්‍යවස්ථාවේ VI ඡේදයේ 27(5) වගන්තියෙන් පෙන්වා දි ඇති රාජ්‍ය ප්‍රතිපත්තියෙහි නියෝග කොට ඇති මුලධර්ම සහ මුලික යුතුකම් වලින් ප්‍රකාශ වේ. එසේම එම වගන්තියෙන් “විශේෂ සැලකිලි සහ වෙනස්කම් තුරන් කිරිම ඉගැන්වීම, අධ්‍යාපනය දීම සහ තොරතුරු ක්ෂේත්‍රයන්හි ඵලදායි පියවර ගත යුතුය” යන්න ප්‍රකාශ කොට තිබේ.

ඉහත කී ප්‍රතිපත්තීන් උල්ලංඝනය කරමින්, පියා දෙමළ ජාතිකයකු සහ කතෝලික භක්තිකයකු බැවින් සිය දරුවා පාසැලට ඇතුලත් කර නොගැනීමට අගනුවරට ආසන්න ප්‍රධාන ගැහැනු පාසැලක් කටයුතු කර ඇත. මේ සම්බන්ධයෙන් නිර්දේශයක් නිකුත් කලද එහි ප්‍රතිඵල මෙතෙක් මා වෙත වාර්තා කර නැත.

ජනවාර්ගික හා ආගමික සහජීවනය රැකගැනීම උදෙසා ප්‍රතිපත්ති සම්පාදකවරු දැඩි උනන්දුවකින් කතා කලත් දැනට ජනවාර්ගිකත්වය හා ආගම් පදනම් කොට හුදෙකලා වි සිටින පර්ෂද පාසල් සංකල්පයෙන් මිදී ලාබාල වියේදීම විවිධ පසුබිම්වලින් පැමිණි සිසුන් එකට එක්කිරිම සිදුකල හැකි අතර, විවිධ ජාතීන් අතර පවතින අවිශ්වාසය අකාමකා දැමීමට එය දිගු ගමනක් වුවත්, ඒ සම්බන්ධව අමතක කර සිටීමට ඔවුන් පෙළඹී ඇත.

අසල්වාසී පදිංචිකරුවන් අපහසුතාවයට පත් කරන අන්දමට නීතිවිරෝධීව තමන්ගේ ඉඩම්වල ගොඩනැගිලි තනන්නන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක කිරිමේදී සමහර නාගරික සභාවන් ඉතාමත් නිද්‍රාශීලි

පිළිවෙත් අනුගමනය කරනු ලබයි. මෙවැනි තැනීම් ඉවත් කරන ලෙසට නිකුත් කරන ලද නිර්දේශ සම්බන්ධයෙන් බලාපොරොත්තු ප්‍රතිඵල ලබා නොදෙන ලදී.

මධ්‍යම හා පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ සේවය කරන නිලධාරින්ට එරෙහිව ලැබෙන පැමිණිලි ප්‍රමාණය ඉතා ඉහළය. ඉසුරුපායේ ඇති අමාත්‍යාංශයට හා පළාත් අධ්‍යාපන බලධාරීන් වෙත අප විසින් යවනු ලබන ලිපිවලට අදාල ප්‍රතිචාර දැක්වීම බොහෝ මන්දගාමීය. මේ නිසා අපට අවශ්‍ය වාර්තා ගෙන්වා ගැනීමට සිහිකැඳවීම් කිහිපයක් යැවීමට සිදු වේ. කෙසේවුවද, විමර්ශන සඳහා අදාල නිලධාරින්ගේ පැමිණීමේ යම් වර්ධනයක් දක්නට ඇත. යම් විදුහල්පතිවරයෙකුට තමන් අකැමැති ගුරුවරයෙකු ස්ථාන මාරුකොට යැවීමට අවශ්‍ය වූ විට අදාල ගුරුවරයාගේ කාලසටහන එම ගුරුවරයාට ලබා නොදී සිටිමින් එවැනි මාරුකිරීම් සඳහා නිර්මානය කිරීම් කරනු මා නිරීක්ෂණය කර ඇත.

පරීක්ෂණයක හෝ විමර්ෂණය කිරීමක නිරතව සිටින ඕනෑම විටක ආරවුලට සම්බන්ධ ගැටළුවෙහි යුක්තියුක්තභාවය හෝ  සාධාරණත්වය පිළිබඳ අවබෝධ කර ගැනීමට නිසි සැලකිල්ල යොමු නොකර, නිලධාරියා තම තීරණය හෝ ක්‍රියාමාර්ගය සාධාරණීකරණය කිරීම සඳහා කාලයත්, ශ්‍රමයත් වැය කරයි. සිදු කළ වරදේ බරපතලකම සහ එහි හානිකර බලපෑමත්, තමන්ට එරෙහිව එල්ල වන පැමිණිලිත් නොසලකමින් නිලධාරින් දිගින් දිගටම එවැනිම වැරදි ක්‍රියාමාර්ග හා සාවද්‍ය තීරණ ගැනීමෙහි නිරත ව සිටින බව පෙනේ.

එමඟින් යහපාලනයේ වැඩිදියුණුවක් සිදු නොවන්නා සේම, රජයේ නිලධාරීන් මහජනයා කෙරෙහි ප්‍රතිවාදී ආකල්ප දැරීමෙහි අඛණ්ඩව නියුක්ත වුවහොත් නිසැවකම පරිපාලනය දූෂ්‍ය තත්වයට පත් වේ. තවද, රජයේ නිලධාරීන් සාධාරණ පැමිණිලි ඉදිරිපත් කරන පුරවැසියන් පිළිගැනීමට සහ ඔවුනට ඇහුම්කන් දීමට සූදානම් නොමැතිව ඔවුන්ව දුරස්කර ගැනීමට උත්සාහ කරන්නේ නම්, එය යහපාලනයේ දුර්වලතාවකි.

මහජන පැමිණිලි වලින් පැහැදිලි වන අන්දමට නිලධාරීන් සහ ආයතන විසින් පමණට වඩා නීතියට යටත්වීම හා විධිමත් බව පමණට වඩා පිළිපැදීම මඟින් ප්‍රමාදයන් සිදුවන බවටත්, සේවක සාධාරණත්වය සහ සාධාරණ පාලනය පැහැර හැරීම, රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාපටිපාටි, රෙගුලාසි සහ රීති පිළිබඳ සාවද්‍ය අර්ථකතනය සහ සාවද්‍ය භාවිතය, ඉක්මන් අපක්ෂපාතී නිරවුල්කරණයකට මඟ පෑදීමට හැකි අයුරින් පැමිණිලිකරුවන් හමු වී ගැටළු විසඳීමට පසුබට වීම, අගතියට පත් පාර්ශවයට ඇහුම්කන් නොදී ඒකපාර්ශ්වික ක්‍රියාමාර්ග ගැනීම, සුළු ගැටළු විසඳීමට තීරණ ගැනීම ප්‍රමාද කිරීම, එදිරිවාදී ස්වභාවය, සංවේදී නොවීම සහ අසාධාරණ ක්‍රියාමාර්ගය නිසා අගතියට පත් තැනැත්තා කෙරෙහි

නොසැලකිලිමත් වීම යනාදිය වැලැක්වීම ගැටළු තත්වයන් මතුවන අතර, පැමිණිලිවලට අදාලව ලබාදුන් නිර්දේශ සඳහා දෙපාර්තමේන්තු සහ අධිකාරී විසින් ක්‍රියාත්මක කිරීම ප්‍රමාද කිරීම සාමාන්‍ය පුරුද්දක් බවට පත්ව ඇත.

කලින් අවස්ථාවකදී ව්‍යවස්ථා සංශෝධනයට අදාලව, මෙම ආයතනයට සම්බන්ධව සිදුවිය යුතු සංශෝධනයන් සම්බන්ධයෙන් මාගේ අදහස් ඉදිරිපත් කරන ලෙසට දන්වා තිබූ අතර, ඒ අනුව සමාජයේ හිමිකම් අඩු අහිංසක ජනතාව වෙත ලබාදිය හැකි උසස් සේවාවන් ප්‍රධානය කිරිමේ අරමුණින් සහ මෙම ආයතනයෙන් ඉටුවිය යුතු සේවාවේ උසස්බවත්, දැනට පවත්නා තත්ත්වය වඩාත් ඉහල නැංවීමට ගතහැකි ක්‍රමවේදයන් ද මා විසින් අනුකමිටුවට ඉදිරිපත් කරන ලදී. කෙසේ වෙතත් එකී නිර්දේශ ප්‍රතික්ෂේප කරමින් අදාල සාමාජිකයන්ගේ මතය වී ඇත්තේ, මෙම ආයතනයේ නිර්දේශ, ද්විපාර්ශව පරික්ෂණයකින් පසුව නිකුත් නොකරන බැවින්, පිළිගත නොහැකි බවට ය. මෙම කරුණු සම්බන්ධයෙන් මා මැදිහත් විමට බලාපොරොත්තු නොවුවත්, කෙටියෙන් සඳහන් කල යුත්තේ “විමසීම” යනු කුමක්ද යන්නත්, පනතේ අදාල අනිකුත් වගන්ති කෙරෙහිද අවධානය යොමු කරවීම පමණි. දෙපක්ෂයටම අදාල කරුණු ඉදිරිපත් කිරිමට මෙම ආයතනය අවශ්‍ය තරම් ඉඩකඩ සකසා දි ඇත. විශේෂයෙන් පැහැදිලි කළයුතු කරුණක් වන්නේ, නීතිඥවරුන්ට මෙම ආයතනයේ පරීක්ෂණ වලදී පෙනි සිටිමට නොහැකි විමත්, සහ මෙම ආයතනය නිලවාදය ආරක්ෂා කිරිමට පිටුවහලක් වන ස්ථානයක් නොවීමත් ය.

ඉහත සඳහන් සියලු දුෂ්කරතා මධ්‍යයේ, ලැබෙන පැමිණිලිවලින් සැලකිය යුතු ප්‍රමාණයක කටයුතු අවසන් කිරීමට අප කාර්යාලය සමත් විය. කාර්යාලයේ අනුමත කාර්ය මණ්ඩලය සම්පූර්ණව නොමැති අතර ගණකාධිකාරිවරයෙකු හෝ පොත් තබන්නෙකු හෝ මෙම කාර්යාලයට පත් කර නොමැත. නිලධාරින් මෙම කාර්යාලයේ සේවය කිරීමට අකමැත්තක් දක්වන බවද සැලකිල්ලට ගත යුතුය. ප්‍රමාණවත් ලෙස අතිකාල සේවයේ යෙදීමට හෝ වෙනත් කාර්යාලවලට අදාලව ගෙවනු ලබන අමතර දීමනා ලැබීමට අවස්ථාවක් නොලැබීම වැනි කරුණු මීට බලපා ඇත.

## සංඛ්‍යානමය විශ්ලේෂණය

| | | | |
|---|---|---|---|
| 2015 වර්ෂයේ ඉදිරියට ගෙනෙන ලද පරීක්ෂණ සිදුකිරීමට නියමිත ඉතිරි පැමිණිලි සංඛ්‍යාව | | 459 | |
| 2016.01.01 දින සිට 2016.12.31 දින දක්වා ලැබුණු මුළු පැමිණිලි සංඛ්‍යාව | | | |
| (අ) සෘජුව ලැබුණු පැමිණිලි | 1310 | | |
| (ආ) විමර්ශනය කර වාර්තා කිරීම සඳහා මහජන පෙත්සම් කාරක සභාව යොමු කරන ලද පැමිණිලි | 112 | 1422 | |
| 2016 වර්ෂය තුළ පරීක්ෂණ සිදු කිරීමට නියමිතව තිබූ මුළු පැමිණිලි සංඛ්‍යාව | | | 1881 |
| 2016 වර්ෂය තුළ පරීක්ෂණ සිදු කරන ලද සමස්ථ පැමිණිලි සංඛ්‍යාව | | | |
| (අ) ලසු ලෙස කටයුතු අවසන් කරන ලද පැමිණිලි | | | |
| (1) පරීක්ෂණ සිදු කිරීමෙන් තොරව සමතයකට පත්කරන ලද පැමිණිලි සංඛ්‍යාව | 100 | | |
| (2) එකම පැමිණිල්ල සමාන්තර අධිකරණයකට/ ආයතනයකට යොමු කිරීම නිසා පරීක්ෂණ සිදුකිරීමකින් තොරව බැහැර කරන ලද පැමිණිලි සංඛ්‍යාව | 86 | | |
| (3) පරීක්ෂණ සිදුකිරීමට ප්‍රමාණවත් තොරතුරු නොලද පැමිණිලි සංඛ්‍යාව | 69 | | |
| (4) සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීම පිණිස අදාල ආයතනය වෙත යොමු කරන ලද පැමිණිලි සංඛ්‍යාව | 35 | | |
| (5) සහනයක් සඳහා යොමුකිරීමට හේතු නොතිබුණ පැමිණිලි | 78 | | |
| (6) ඔම්බුඩ්ස්මන්වරයාගේ බලතල වලින් පරිබාහිර පැමිණිලි | 66 | | |
| (7) අධික ලෙස ප්‍රමාදවීම මත ඉදිරිපත් වූ පැමිණිලි | 73 | | |
| (8) අදාල ආයතන හා දෙපාර්තමේන්තු මගින් වාර්තා කැඳවීමෙන් පසු එය පැමිණිලිකරුට දැන්වීමෙන් අනතුරුව ඉදිරි පියවර ගැනීම නවතාලූ පැමිණිලි | 425 | | |
| (9) වාර්තා කැඳවීමෙන් පසු ඉල්ලීම් ඉටුවී ඇති පැමිණිලි | 110 | | |
| (10) සෘජුව වෙනත් ආයතන වෙත යොමු කළ ලිපිවල පිටපත් ලෙස කාර්යාලය වෙත යොමු කරන ලද පැමිණිලි | 328 | | |
| (11) වෙනත් ඔම්බුඩ්ස්මන් ආයතන වෙත යොමු කරනු ලැබූ පැමිණිලි | 25 | 1395 | |
| පරීක්ෂණ සිදු කරන ලද සහ අන්තර් පාර්ශව විමර්ශන වලින් අනතුරුව වාර්තා කරන ලද පරීක්ෂණ සංඛ්‍යාව | | 29 | 1424 |
| 2016.12.31 දින වන විට පරීක්ෂණ පැවැත්වීමට සහ වාර්තා කිරීමට නියමිත ඉතිරි පරීක්ෂණ සංඛ්‍යාව | | | 457 |

## මාසික විශ්ලේෂණය

2016 වර්ෂයේදී ආයතනයට ඉදිරිපත්ව තිබූ සම්පූර්ණ පැමිණිලි සංඛ්‍යාව 2015 වර්ෂයේ ඉතිරියත් සමඟ 1422 විය. 2016 අප්‍රේල් මාසයේ දී කාර්යාලයට අඩුම පැමිණිලි සංඛ්‍යාව ලැබුණු අතර, එය පැමිණිලි 80ක් විය. වැඩිම පැමිණිලි සංඛ්‍යාවක් වන 156, මාර්තු මස දී ඉදිරිපත් විය. විස්තර 2 වන වගුවේ පැහැදිලි කර ඇත.

වගුව: 2 - 2016 වර්ෂයේදී එක් එක් මස තුළ ලද පැමිණිලි සංඛ්‍යාව.

| | මාසය | පැමිණිලි සංඛ්‍යාව |
|---|---|---|
| 01 | ජනවාරි | 81 |
| 02 | පෙබරවාරි | 152 |
| 03 | මාර්තු | 156 |
| 04 | අප්‍රේල් | 80 |
| 05 | මැයි | 105 |
| 06 | ජූනි | 84 |
| 07 | ජූලි | 99 |
| 08 | අගෝස්තු | 132 |
| 09 | සැප්තැම්බර් | 127 |
| 10 | ඔක්තෝබර් | 146 |
| 11 | නොවැම්බර් | 130 |
| 12 | දෙසැම්බර් | 130 |
| | එකතුව | 1422 |


180
160
140
120
100
80
60
40
20
0
ජනවාරි
පෙබරවාරි
මාර්තු
අප්‍රේල්
මැයි
ජූනි
ජූලි
අගෝස්තු
සැප්තැම්බර්
ඔක්තෝබර්
නොවැම්බර්
දෙසැම්බර්

වර්ෂය තුළ දී ගොනු කරන ලද පැමිණිලි 1039ක් පුරුෂ පාර්ශවය විසින් ද 383ක් ස්ත්‍රී පාර්ශවය විසින් ද ඉදිරිපත් කර ඇත. 3 වන වගුවේ විස්තර කර ඇත.

වගුව: 3 - 2016 වර්ෂයේ දී ස්ත්‍රී පුරුෂ වශයෙන් ලද මුළු පැමිණිලි සංඛ්‍යාව.

| මාසය | පුරුෂ | ස්ත්‍රී | එකතුව |
|---|---|---|---|
| 01. ජනවාරි | 58 | 23 | 81 |
| 02. පෙබරවාරි | 113 | 39 | 152 |
| 03. මාර්තු | 92 | 64 | 156 |
| 04. අප්‍රේල් | 64 | 16 | 80 |
| 05. මැයි | 73 | 32 | 105 |
| 06. ජූනි | 63 | 21 | 84 |
| 07. ජූලි | 75 | 24 | 99 |
| 08. අගෝස්තු | 103 | 29 | 132 |
| 09. සැප්තැම්බර් | 92 | 35 | 127 |
| 10. ඔක්තෝබර් | 104 | 42 | 146 |
| 11. නොවැම්බර් | 99 | 31 | 130 |
| 12. දෙසැම්බර් | 103 | 27 | 130 |
| | 1039 | 383 | 1422 |

## දිස්ත්‍රික්ක විශ්ලේෂණය

2016 වර්ෂය තුළ වැඩිම පැමිණිලි සංඛ්‍යාවක් ලැබී ඇත්තේ කොළඹ දිස්ත්‍රික්කයෙන් වන අතර, එය 159කි. අනතුරුව වැඩිම පැමිණිලි සංඛ්‍යාව ලෙස ගාල්ල දිස්ත්‍රික්කයෙන් පැමිණිලි 152ක් ද, මහනුවර දිස්ත්‍රික්කයෙන් පැමිණිලි 145ක් ද ලැබුණි.

වගුව: 4 පැමිණිලිකරුවන්ගේ නිත්‍ය පදිංචි දිස්ත්‍රික්කය අනුව කරන ලද වර්ගීකරණයට අනුව 2016 වර්ෂයේදී ලද මුළු පැමිණිලි සංඛ්‍යාව.

| දිස්ත්‍රික්කය | 2016 වර්ෂයේදී ලද පැමිණිලි සංඛ්‍යාව |
|---|---|
| කොළඹ | 159 |
| ගම්පහ | 85 |
| කළුතර | 94 |
| මහනුවර | 145 |
| මාතලේ | 38 |
| නුවරඑළිය | 40 |
| ගාල්ල | 152 |
| මාතර | 88 |
| හම්බන්තොට | 31 |
| යාපනය | 26 |
| මන්නාරම | 03 |
| වවුනියාව | 01 |
| මුලතිව් | 01 |
| කිලිනොච්චි | 00 |
| මඩකලපුව | 19 |
| අම්පාර | 44 |
| ත්‍රිකුණාමලය | 17 |
| කුරුණෑගල | 113 |
| පුත්තලම | 19 |
| අනුරාධපුරය | 53 |
| පොළොන්නරුව | 74 |
| බදුල්ල | 49 |
| මොණරාගල | 19 |
| රත්නපුර | 94 |
| කෑගල්ල | 56 |
| විදේශීය | 02 |
| එකතුව | 1422 |


180
160
140
120
100
80
60
40
20
0
කොළඹ
ගම්පහ
කළුතර
මහනුවර
මාතලේ
නුවරඑළිය
ගාල්ල
මාතර
හම්බන්තොට
යාපනය
මන්නාරම
වවුනියාව
මුලතිව්
කිලිනොච්චි
මඩකලපුව
අම්පාර
ත්‍රිකුණාමලය
කුරුණෑගල
පුත්තලම
අනුරාධපුරය
පොළොන්නරුව
බදුල්ල
මොණරාගල
රත්නපුර
කෑගල්ල
විදේශීය

## විෂය විශ්ලේෂණය

2016 වර්ෂය තුළ දී කාර්යාලවලට සේවකයන් පත්කිරීම, සේවය අවසන් කිරීම, උසස්වීම්, වැටුප් විෂමතා, වැටුප් වර්ධක, හිඟ මුදල්, රජයේ සේවකයන් මෙන්ම පොලිස් නිලධාරීන් විසින් බලය අනිසි ලෙස යෙදවීම, විශ්‍රාම වැටුප්, සේවක අර්ථසාධක අරමුදල් ගෙවීම, අනවසර ඉදිකිරීම් සහ හිරිහැර යන කරුණු සම්බන්ධයෙන් සැලකිය යුතු පැමිණිලි ප්‍රමාණයක් ලැබී තිබුණි.

5 වගුව **2016 වර්ෂය තුළ විෂයානුගතව මහජන නිලධාරීන්ට විරුද්ධව ලැබූ පැමිණිලි මුළු සංඛ්‍යාව**

| | | 2016 |
|---|---|---|
| 01 | සේවා අන්තර්ග්‍රහණය කිරීම්, බඳවා ගැනීම්, පත්වීම්, ස්ථිර කිරීම්, පෙරදාතම් කිරීම් | 128 |
| 02 | සේවය අවසන් කිරීම්, නැවත සේවයේ පිහිටුවීම්, දීර්ඝ කිරීම්, කාර්යක්ෂමතා කඩඉම් | 109 |
| 03 | උසස්වීම්, ජ්‍යෙෂ්ඨත්වය | 76 |
| 04 | ඉඩම් බලපත්‍ර, රජයේ ඉඩම් ප්‍රදානය | 102 |
| 05 | ප්‍රමාදය, නොහැකියාව, නොසලකා හැරීම, බලය අනිසි ලෙස භාවිත කිරීම | 136 |
| 06 | වැටුප් විෂමතා, වැටුප් වර්ධක, හිඟ මුදල්, දීමනා | 105 |
| 07 | විශ්‍රාම වැටුප්, වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප | 104 |
| 08 | වන්දි ගෙවීම, දුප්පතුන්ට සහනාධාර, සමෘද්ධි | 32 |
| 09 | සේවා ස්ථානයෙන් මාරු කිරීම | 58 |
| 10 | සුනාමි සහනාධාර | 04 |
| 11 | විශ්ව විද්‍යාල/පාසැල් වලට ඇතුලත් වීම, විභාග ප්‍රතිඵල | 109 |
| 12 | සේවක අර්ථසාධක අරමුදල, සේවක භාරකාර අරමුදල, පාරිතෝෂික දීමනා | 14 |
| 13 | පොලිසිය බලය අනිසි ලෙස භාවිත කිරීම/අක්‍රීය වීම | 24 |
| 14 | අනවසර ඉදිකිරීම්/පීඩාවන් | 53 |
| 15 | ණය, අයකිරීම්, නැවත උපලේඛනගත කිරීම | 16 |
| 16 | බලපත්‍ර, ගොඩනැගිලි අවසර පත්‍ර | 18 |
| 17 | විදුලිය, ජලය, දුරකතන සම්බන්ධ කිරීම් හා විසංධි කිරීම් | 12 |
| 18 | සේවා ස්ථානයේ දී වන හිරිහැර | 45 |
| 19 | මාර්ග පද්ධති | 39 |
| 20 | විවිධ | 238 |
| | මුළු ගණන | 1422 |

## <u>අමාත්‍යාංශ/ මහජන ආයතන විශ්ලේෂණය</u>

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය (280) අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය (239) යන අමාත්‍යාංශවල නිලධාරීන්ට එරෙහිව පැමිණිලි විශාල සංඛ්‍යාවක් ලැබී ඇත.

බලපත්‍ර සහ ප්‍රදානයන් නිකුත් කිරීම් වලට අදාලව ප්‍රාදේශීය ලේකම්වරුන්ට එරෙහිව පැමිණිලි වැඩි ප්‍රමාණයක් ලැබී ඇත.

අනුප්‍රාප්තිය සම්බන්ධ නීතිය පැහැදිලිව පනතෙහි දක්වා තිබුණද, භුක්තිය හා පදිංචිය පිළිබඳ ගැටලු විසදීම එතරම් සරල නොවේ. එසේම, විමර්ශන වලදී පැහැදිලි වී ඇත්තේ, ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල සේවය කරන ඇතැම් නිලධාරීන් ඉඩම් සංවර්ධන ආඥා පනතේ විධිවිධාන යටතේ අවසරපත්/ප්‍රදානයන් නිකුත් කිරීමේදී පිළිගතහැකි මට්ටමකට කටයුතු නොකරන බවට ය. තවද පිටස්තර පුද්ගලයින්ගේ අනවශ්‍ය මැදිහත්වීම් ද, නිසි ප්‍රතිඵල සම්බන්ධයෙන් බලපෑ අවස්ථා වාර්තා වී ඇත.

වගුව 6 <u>අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, අධිකාරි සහ රජයේ ආයතන වල නිලධාරීන්ට විරුද්ධව ලැබූ පැමිණිලි සංඛ්‍යාව - 2016</u>

| අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, අධිකාරී ආදී ... | සංඛ්‍යාව 2016 |
|---|---|
| රාජ්‍ය පරිපාලන | 280 |
| අධ්‍යාපන හා උසස් අධ්‍යාපන | 239 |
| සංස්ථා, අධිකාරී (CPC, CEB, SLAA, RDA) | 68 |
| රාජ්‍ය සේවා කොමිසම (මධ්‍යම සහ පළාත්) | 43 |
| ආරක්ෂක සහ අභ්‍යන්තර ආරක්ෂක | 90 |
| පළාත් සභා හා පළාත් පාලන ආයතන | 93 |
| ගමනාගමන (SLCTB, CGR, CMV) | 43 |
| සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය | 73 |
| කම්කරු | 05 |
| මුදල් | 03 |
| කෘෂිකර්ම | 34 |
| රජයේ බැංකු | 13 |
| විශ්‍රාම වැටුප් | 96 |
| අධිකරණ | 18 |
| වාරිමාර්ග සහ මහවැලි අධිකාරිය | 34 |
| තැපැල් සහ විදුලි සංදේශ | 19 |
| සමාජ සේවා/ සමෘද්ධි/ තැනැත්තන්, දේපල හා කර්මාන්ත පුනරුත්ථාපන අධිකාරිය | 11 |
| ඉඩම් සහ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම | 43 |
| සමුපකාර සංවර්ධනය | 21 |
| ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 12 |
| රෙජිස්ට්‍රාර් ජනරාල් | 03 |
| වන සංරක්ෂණ | 08 |
| වැවිලි | 01 |
| වෙනත් | 172 |
| මුළු | 1422 |

## කාර්ය මණ්ඩලය

මෙම කාර්යාලයට අනුමත සේවක සංඛ්‍යාව තිහකි. පහත දක්වා ඇති සංවිධාන ධූරාවලියේ පෙන්වා ඇති පරිදි 2016 වසරේ අවසානය වන විට මෙම කාර්යාලයට අනුයුක්ත කර තිබුණේ නිලධාරීන් 18 දෙනෙකු පමණි.

## සංවිධාන ධූරාවලිය

ඔම්බුඩ්ස්මන්

- භාෂා පරිවර්තක (දෙමළ/ඉංග්‍රිසි) -01 (I පංතිය)
- භාෂා පරිවර්තක (ඉංග්‍රිසි/සිංහල) -01 (I පංතිය)

පරිපාලන නිලධාරි -01
ආයතන

- (රා.ක.ස.සේ.I ශ්‍රේණිය) - 01
- (රා.ක.ස.සේ.III ශ්‍රේණිය) - 03
- (රා.ක.ස.සේ.) (පුරප්පාඩු ) - 01

  - රියදුරු (පුරප්පාඩු) - 02
  - කා.සේ.සේ.**II** - **02**
  - කා.සේ.සේ.**III** **- 02**
  - සනී/කම්කරු (කොන්ත්‍රාත් පදනම) - 01

පරිපාලන නිලධාරි -01
**පැමිණිලි (පුරප්පාඩු)**

- (රා.ක.ස.සේ.I ශ්‍රේණිය) - 02
- (රා.ක.ස.සේ.III ශ්‍රේණිය) - 06
- (රා.ක.ස.සේ.) (පුරප්පාඩු ) - 03

## වාර්ෂික අයවැය

පුනරාවර්තන වියදම් වශයෙන් රු:15,696,000.00ක මුදලක් ද, ප්‍රාග්ධන වියදම් වශයෙන් රු:350,000.00ක මුදලක් ද වශයෙන් රු:16,046,000.00ක මුළු මුදලක් 2016 වර්ෂය සඳහා වෙන් කරන ලද අතර, මෙම වසර සඳහා තත්‍ය වියදම රු:15,711,000.00ක් වූ අතර, ඉතිරි වූ ප්‍රතිපාදන රු:335,000.00කි.

### ශීර්ෂ 22 - පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් කාර්යාලය

### 01 - මෙහෙයුම් ක්‍රියාකාරකම්

### 01 - සාමාන්‍ය පරිපාලනය හා ආයතනික සේවා

රු:000

| විෂය | විස්තරය | 2016 ශුද්ධ ප්‍රතිපාදන | 2016 තත්‍ය වියදම් |
|---|---|---|---|
| | **පුනරාවර්තන වියදම්** | **15696** | **15588** |
| | **පුද්ගලික පඩිනඩි** | **9192** | **9167** |
| 1001 | වැටුප් හා වේතන | 5034 | 5027 |
| 1002 | අතිකාල හා නිවාඩු දීමනා | 73 | 68 |
| 1003 | වෙනත් දීමනා | 4085 | 4072 |
| | **ගමන් වියදම්** | **1760** | **1759** |
| 1101 | දේශීය | 13 | 12 |
| 1102 | විදේශ | 1747 | 1747 |
| | **සැපයීම්** | **668** | **637** |
| 1201 | ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා | 410 | 402 |
| 1202 | ඉන්ධන | 250 | 227 |
| 1203 | ආහාරපාන හා නිල ඇඳුම් | 08 | 08 |
| | **නඩත්තු වියදම්** | **674** | **671** |

| | | | |
|---|---|---|---|
| 1301 | වාහන | 569 | 568 |
| 1302 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 105 | 103 |
| 1303 | ගොඩනැගිලි හා ඉදිකිරීම් | - | - |
| | **ශිවිසුම්ගත සේවා** | **2973** | **2929** |
| 1401 | ප්‍රවාහන | 20 | 17 |
| 1402 | තැපැල් හා සන්නිවේදන | 500 | 475 |
| 1403 | විදුලිය හා ජලය | 240 | 225 |
| 1404 | කුලී හා දේශිය බදු | 2199 | 2199 |
| 1405 | වෙනත් | 14 | 13 |
| | **මාරු කිරීම්** | **429** | **425** |
| 1505 | සම්මාදම් හා දායක මුදල් | 324 | 323 |
| 1506 | දේපල ණය පොලී | 105 | 102 |
| | **ප්‍රාග්ධන වියදම්** | **350** | **123** |
| | **ප්‍රාග්ධන වත්කම් අත්කර ගැනීම** | **290** | **63** |
| 2102 | ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ | 290 | 63 |
| | **හැකියා වර්ධනය** | **60** | **60** |
| 2401 | පුහුණු හා හැකියා වර්ධනය | 60 | 60 |
| | **මුළු වියදම** | **16046** | **15711** |
| | **මුළු මූල්‍යකරණය** | **16046** | **15711** |
| | මූල්‍ය | | |
| | දේශීය | 16046 | 15711 |

(එල්.ඒ.තිස්ස ඒකනායක)

පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්

(ඔම්බුඩ්ස්මන්)